www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සංක්‍රමනික පෙලපාලිවලින් ඇමරිකාවෙහි පන්ති අරගලයට කෙරෙන ඇඟවුම්

## The implications of the immigrant demonstrations for the class struggle in America

**සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශය**
**2006 මැයි 04**

එක්සත් ජනපදයේ නගර හරහා පැතිර ගිය සංක්‍රමනික කම්කරුවන්ගේ පෙලපාලි, වර්ජන හා සත්‍යග්‍රහ වනාහි එක්සත් ජනපදය තුල මෙන් ම ජාත්‍යන්තරව ද පන්ති අරගලය තියුනු වීමක සංඥාවක් වන්නේ ය.

මැයි මස පලමු වන දා ලොස් ඇන්ජලිස් සිට නිව් යෝක් දක්වා සහ මියාමි සිට සියැටල් දක්වා මහ නගරවල ද ඒ අතර පිහිටි සුලු නගර අනේක සංඛ්‍යාවක ද වචනාර්ථයෙන් ම දසලක්ෂ සංඛ්‍යාත ජනයා වීදි බටහ. මාර්තුවේ සිට ම ගොඩ නැගෙමින් පවතින මෙම ජන විරෝධතා ව්‍යාපාරය එහි ප්‍රමානයෙන් හා ජාතික පරිමාවෙන් යන දෙකෙන් ම පෙර නුවූ විරූ තරම් වූවක් වේ.

පෙලපාලි දැක්වූ අය ද වැඩ වැරූ අය ද එසේ කලේ ජනාධිපති බුෂ් සේ ම ඩිමොක්‍රැටික් දේශපාලනඥයන් ද කල අනතුරු ඇඟවීම් නො තකා ය. එසේ ම ඔවුන් ක්‍රියාවට බැස්සේ, මෑතක සිදු වූ ජාතික පරිමාන ෆැක්ටරිවලට කඩා පැනීම් මෙන් ම ආන්ඩුවෙන් එල්ල වූ අත් අඩංගුවට ගැනීමේ හා පිටුවාහල් කිරීමේ තර්ජන ද අන්ත දක්ෂිනාංශික කොටස්වල ප්‍රචන්ඩත්වය ද විසින් මතු කරනු ලැබ තිබූ නග්න බිය වැද්දීම් හමුවේ ද වේ.

ඇමරිකානු ආන්ඩුව විසින් සමාජමය වසයෙන් නීචයන් ලෙස සලකනු ලැබූ කම්කරු ස්තරයක් හදිසියේ ම සටන්කාමී, ප්‍රබල හා හඬක් සහිත සමාජ බලවේගයක් ලෙස මතු වී තිබේ.

ඇමරිකානු කම්කරු පන්තියේ ඉමහත් ම පීඩනයට හා සූරා කෑමට ලක් වූ කොටසේ මෙම ක්‍රියාවන් තුල ගැඹුරු සමාජ සහ දේශපාලන මූලයන් ද දුරදිග යන වෛෂයික වැදගත්කමක් ද පවතී.

ඒ හා සමග ම, ඒවා සමස්තයක් ලෙස කම්කරු පන්තිය තුල දේශපාලන විඥ්ඥානය වර්ධනය කිරීමේ දී ජය ගත යුතු ගැටලු හදිසි භාවයකින් මතු කරයි.

පෙලපාලි දිග හැරී ගියේ ඇමරිකාව තුල ඉහල නගින ආතතිමය අස්ථාවර දේශපාලන තතු යටතේ ය. බුෂ් පරිපාලනයට සහාය දෙන්නේ ඇමරිකානු ජනගහනයෙන් යන්තම් තුනෙන් පංගුවක් පමනක් බව මත විමසුම් එකකට පසු එකකින් පෙන්නුම් කෙරෙයි. මේ පෙර නුවූ විරූ දේශපාලන කඩා වැටීමට හේතු පාදක වන්නේ කුමක් ද? ජනමාධ්‍යවලින් වේවා, නමට තිබෙන විරුද්ධ පක්ෂය වන ඩිමොක්‍රැටිකයන්ගෙන් වේවා, යුද්ධය පිලිබඳව හෝ ප්‍රජාතාන්ත්‍රිය අයිතීන්ට එල්ල කෙරෙන මහා පරිමාන ප්‍රහාර ගැන හෝ අතිවිශාල කම්කරු ජනයාගෙන් මුදුනත සිටින සියයට 1ක පිරිස අතට ධනය මාරු කිරීම සඳහා සේවය කරන දේශීය පිලිවෙත් සම්බන්ධව හෝ කිසිදු ස්ථිරසාර හෝ බැරෑරුම් අභියෝගයක් ධවල මන්දිරයට එල්ල කෙරී නැත.

එහෙත්, ඉරාකයට එරෙහි නීති විරෝධී යුද්ධය තෙවැනි වසරට එලඹීම හා ජීවන තත්වයන්ගේ වේගවත් පරිහානිය සහ ඓතිහාසිකව පෙර නුවූ විරූ සමාජ ධ්‍රැවාන්තගත වීම සමග ඒකාබද්ධ වූ බුෂ් පරිපාලනයේ ක්‍රියා මාර්ගයන් ජන විඥ්ඥානය තුල ගැඹුරු බලපෑමක් ඇති කිරීම අරඹා තිබේ.

සංක්‍රමනික කම්කරුවන්ගේ ජනතා ව්‍යාපාරය හැඩ ගැන්වීමේ දී විඥ්ඥානයේ ඇති වී පවත්නා මෙම වෙනස ඉටු කර ඇති කාර්ය භාරය සුලුපටු නො වේ. ඒවා විශාල වසයෙන් ම ඩිමොක්‍රැටික් පක්ෂයේ හෝ වෘත්තීය සමිති නිලධරයේ හෝ ආනුභාවයෙන් පිටස්තරව දිග හැරී ගිය අතර එය එතරම් ම විශාල සහ පුපුරනසුලු ආකාරයක් ගැනීමට හේතුව ද එය ම ය. මහා ව්‍යාපාරික ඩිමොක්‍රැටික් දේශපාලකයන් හා සන්ධානගත වූ ස්නායු ආබාධිත වෘත්තීය සමිති මෙවලම සේවය කරන්නේ සමාජ විරෝධයේ අව්‍යාජ ව්‍යාපාර අඩපන කිරීමට හා ගබ්සා කිරීමට පමනකි.

සංක්‍රමනික කම්කරු බලකායේ වර්ධනය ඇමරිකාව තුල කම්කරු පන්ති සංයුතියෙහි සමම්තයක් ලෙස සිදු වෙමින් පවතින රැඩිකල් වෙනස්කම්වල කොටසක් පමනකි. කලෙක ඇමරිකානු ''මධ්‍යම පන්තියට'' අයත් යැයි සැලකුනු සැලකිය යුතු තරමේ ස්තරයන් සමාජ තත්වයෙන් පහලට තල්ලු කරනු ලබමින් ද ඔවුන්ට ස්ථාවර රැකියාවක්, විශ්‍රාම වැටුපක්, සමාගමින් ගෙවන

වෛද්‍ය පහසුකම් සහ අනෙකුත් මූලික සමාජ පහසුකම් අහිමි කරනු ලබමින් ද පවතින තතු යටතේ කම්කරු පන්තියේ ප්‍රමාණය අතිවිශාල ලෙස පුලුල්ව තිබේ.

මෙම ක්‍රියාවලිය ජනගහනයේ විශාල බහුතරය වන කම්කරු ජනයා සහ ප්‍රධාන විධායකයන්ගේ මූල්‍ය කතිපයාධිකාරය, වෝල් වීදියේ මූල්‍යකරුවන් සහ සමාජය විසින් නිර්මානය කරනු ලබන ධනයෙන් කිසි දා නොවූ තරමේ කොටසක අයිතිය දරන සුපිරි පෝසතුන් අතර පරතරය දැවැන්ත ලෙස පලල් වීමක් සමග එකට ගමන් කරයි. 25 වසරකට පෙර සාමාන්‍ය කම්කරුවෙකු ඉපැයූ සෑම ඩොලරයකට ම ප්‍රධාන විධායකයෙකුට ඩොලර් 10ක් ගෙවුනු අතර අද එම අනුපාතය ඩොලරයකට ඩොලර් 431කි.

මෙම තියුනු සමාජ බෙදුම් කඩනය ඇමරිකාව තුල සමාජ කලබැගෑනිවලට කොන්දේසි නිර්මානය කරයි. එසේ ම සංක්‍රමනිකයන්ගේ විරෝධතා ලෝක ධනවාදයේ මධ්‍යස්ථානයෙහි දැවැන්ත පන්ති යුද්ධයන් සඳහා වූ පෙරවදනක් බවට නිසැකව ම පත් වනු ඇත.

ඇමරිකාව "සංක්‍රමණිකයන්ගේ ජාතියකි" යන කවුරුත් දන්නා සත්‍යය එක්සත් ජනපදයට සිදු වූ මහා සංක්‍රමනයන් සංලක්ෂනය කල දරුනු ගැටුම් හා තියුනු සමාජ ප්‍රතිවිරෝධතා සඟවා තැබීමට සෑම විට ම සේවය කර තිබේ. දහනව වන සියවස අවසානයේ සහ විසි වන සියවස ආරම්භයේ යුරෝපයෙන් ආ සංක්‍රමනික රැල්ල ඇමරිකානු නිෂ්පාදනයේ පුපුරනසුලු වර්ධනයට අවශ්‍ය වූ ශ්‍රම බලයේ ප්‍රධාන උල්පත සැපයී ය. එසේ ම ඔවුන්ගේ රැඩිකලීකරනය නූතන ඇමරිකානු කම්කරු පන්තියේ අරගලවල පලමු දැවැන්ත රැල්ලට උර දුන්නේ ය.

## ධනවාදී ගෝලීයකරනයේ බලපෑම

සංක්‍රමනිකයන්ගේ නව රැල්ල ද අවිවාදයෙන් ම එවැනි ම වූ බරසාර බලපෑමක් ඇති කරනු ඇත. එහෙත් එය සිදු වන්නේ රැඩිකල් ලෙස වෙනස් වූ කොන්දේසි යටතේ ය. ඇමරිකාව තව දුරටත් නැගී එන ධනපති බලවතෙකු නොවන අතර, ඒ වෙනුවට එය ලොව විශාලතම නයගැති ජාතිය බවට පත්ව ලෝක වෙලඳ පොල තුල සිය තත්වයේ සාපේක්ෂ පහල යාම ආපසු හැරවීමේ ප්‍රයත්නයක් ලෙස ගෝලීය මිලිටරිවාදය උපයෝගී කර ගනියි.

තව දුරටත් කිව හොත්, අද සංක්‍රමනය සිදු වන්නේ අන්තර් ජාතික සංගත හා ජාත්‍යන්තර බැංකු සත්‍ය ලෙසින් ම ගෝලීය වූ පරිමානයකින් නිෂ්පාදන ක්‍රියාවලිය සංවිධානය කිරීම උදෙසා පරිගනක තාක්ෂනයේ, පනිවුඩ හුවමාරුවේ හා ප්‍රවාහනයේ වර්ධනයන් යොදා ගන්නා ලෝක ධනවාදී නිෂ්පාදනයේ දැවැන්ත වෙනස් වීම් සහිත සන්දර්භයක ය.

ගෝලීයව සංචලනය වන ප්‍රාග්ධනය ජාතික දේශ සීමා විවෘත කර දැමීම සහ ලෝක ගෝලයේ අස්සක් මුල්ලක් නෑර ශ්‍රමය, වෙලඳ පොල හා අමුද්‍රව්‍ය සූරා කෑම මත වන සියලු බාධක සීමා ඉවත් කිරීම ඉල්ලා සිටී. ප්‍රතිඵලය වී ඇත්තේ, විශේෂයෙන් ම ඇමරිකාවේ ලියකියවිලි රහිත කම්කරුවන් බහුතරයකගේ මුල් භූමිය වූ මෙක්සිකෝවේ ද මධ්‍යම හා දකුනු ඇමරිකාවේ ද ජාතික කර්මාන්ත විනාශ මුඛයට යාම, රැකියා විනාශය සහ ජීවන තත්වයන් විනාශකාරී ලෙස පහල වැටීම යි. සංක්‍රමනය පෙරට තල්ලු කරන කොන්දේසි මේවා ය.

එහෙත්, තම ආයෝජන සඳහා දේශ සීමා විවෘත කරන ලෙස ඉල්ලන එම එක්සත් ජනපද-පාදක සංගතවල ම දේශපාලන නියෝජිතයෝ රැකියා සොයමින් ඇමරිකානු දේශ සීමාව හරහා පැමිනීමට උත්සාහ කරන කම්කරුවන්ට එරෙහිව හිස්ටීරියාව අවුලුවන අතර මෙක්සිකෝව සමග වන සැතපුම් 2,000ක් දිග දේශ සීමාව අවහිර කිරීමත් ඒ දිගට මිලිටරිය යෙදීමත් ඉල්ලා සිටිති.

ප්‍රාග්ධනයට දේශ සීමා විවෘත කිරීමත් ශ්‍රමයට අවහිර කිරීමත් සඳහා වූ මෙම ඉල්ලීම හුදෙක් එක්සත් ජනපද ආන්ඩුවට පමනක් සීමා වූ පිලිවෙතක් නොවන අතර එය සියලු ධනපති බලවතුන් විසින් ඒ හෝ මේ ආකාරයට දිගට ම කර ගෙන යනු ලැබේ.

ඇමරිකාවේ දේශපාලන සංස්ථාපිතය සංක්‍රමනිකයන්ගේ විරෝධතාවන් විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් ප්‍රගතිශීලී ආකාරයකට විසඳීමේ ලා අපොහොසත් ය. ඩිමොක්‍රැටික් පක්ෂයේ සහ සමිති නිලධරයේ කොටස් විරෝධතාවන් "නව සිවිල් අයිතිවාසිකම් ව්‍යාපාරයක්" පැන නැග ඒමක් ලෙස වර්ග කිරීමට මාන බලන නමුත්, යථාර්ථය වනුයේ වීදි බසින ජනයා කම්කරුවන් ලෙස තමන්ට හිමි අයිතීන් ඉල්ලමින් ගැඹුරු ලෙස සමාජමය ස්වරූපයක් ගන්නා ඉල්ලීම් ඉදිරිපත් කිරීම යි.

එසේ ම ඇමරිකාවේ පාලක ප්‍රභුව 1960 ගනන්වල සිවිල් අයිතිවාසිකම් අරගලයන්ගේ ප්‍රතිඵලයක් වූ සීමිත සහන - "දුගී බවට එරෙහි යුද්ධය" සමග අනන්‍ය වූ වැඩ සටහන් - මාදිලියේ සහන දෙන්නට ද සූදානම් නැත. මෙම වැඩ සටහන්වලින් බොහොමයක් දැනට මත් විශාල ලෙස කපා දමා ඇති අතර ඉතිරි ඒවාට පහර එල්ල වෙමින් තිබේ.

එක්සත් ජනපද කොන්ග්‍රසය, සංක්‍රමනික කම්කරුවන්ට කෙතරම් නම් දරුනු ලෙස දඬුවම් කල යුතු ද යන ප්‍රතිගාමී විවාදයකින් සංක්‍රමන "ප්‍රතිසංස්කරන" හේතු කොට ගෙන භේදභින්න වී සිටී. එක ම නීති ව්‍යවස්ථාවක් පමනක් සම්මත කල නියෝජිත මන්ත්‍රී මන්ඩලය, ලිපිලේඛන රහිත උදවියට සාපරාධී දුෂ්ටයන්ට සේ සලකන ලෙසත් දේශ සීමාව

අවහිර කරන ලෙසත් ඉල්ලා තිබේ. එක්සත් ජනපදය තුල වැඩි ම කලක් සිටි අයට නීත්‍යානුකූලත්වයට පත් වීම සඳහා දිග් ගැසුනු මාවතක් සපයන අතරේ, දසලක්ෂ ගනනක් රටින් පිට වී යා යුතු යැයි තව දුරටත් ඉල්ලා සිටිනු ඇති ඊනියා සම්මුතියකට දක්ෂිනාංශික රිපබ්ලිකානුවන්ගේ ප්‍රහාරයක් එල්ල වීමෙන් පසුව සෙනෙට් මන්ඩලය කිසිදු පනතක් සම්මත කිරීමේ ලා අසමත් විය.

සෙනෙට් මන්ඩලය තුල වන විසඳිය නොහැකි අවුල් ජාලය ඇමරිකාවේ පාලක ප්‍රභුව හමුවේ සංක්‍රමනික ප්‍රශ්නය මගින් මතු කරනු ලැබ තිබෙන විසඳිය නොහැකි දේශපාලන ප්‍රතිවිරෝධතාවන් පිලිබිඹු කරයි. එක් අතකින් මහා ව්‍යාපාරිකයන්ට ලාභ හා සූරා කනු ලැබූ ශ්‍රමය නො කඩවා අවශ්‍ය වන අතර අනෙක් අතින් ඔවුන් ජාතිකවාදයට සහ පරහීතිකාවට අනුග්‍රහ දක්වයි. ඒ දෙක ම කරනුයේ ''ත්‍රස්තයට එරෙහි යුද්ධය'' තුල වන ගෝලීය මිලිටරිවාදයේ ව්‍යාපාරය තව දුරටත් පෙරට ගෙන යාමට සහ රට තුල කම්කරු පන්තිය භේදභින්න කිරීම සඳහා ය.

රට පුරා ප්‍රාන්ත ව්‍යවස්ථාදායක මන්ඩල තමන්ගේ ම සංක්‍රමනික විරෝධී නීති සම්මත කරමින් - ප්‍රාන්ත 43ක් තුල පනත් 463ක් ඉදිරිපත් කර තිබේ කොන්ග්‍රසයේ හිර වීමට ප්‍රතිචාර දක්වා ඇතැයි *වොෂින්ටන් පෝස්ට්* පුවත්පත අඟහරුවාදා වාර්තා කලේ ය. මින් බොහොමයක් මගින් ලිපි ලේඛන රහිත සංක්‍රමනිකයන් අත් අඩංගුවට ගැනීම, ඔවුන්ට මූලික සේවාවන් මෙන් ම රියැදුරු බලපත්‍ර ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සහ සුලු මාර්ග නීති කඩ කිරීමකට හෝ අසු වන ඕනෑ ම අයෙකුගේ සංක්‍රමනික තත්වය විමසන ලෙස ෆෙඩරල් හා ප්‍රාන්ත පොලීසිවලට අන කිරීම වැනි දන්ඩනීය විධිවිධාන පනවන ලෙස ඉල්ලා තිබේ.

සංක්‍රමනිකයන් ''ඇමරිකානු සිහිනය'' වැලඳ ගැනීම පිලිබඳව ජනමාධ්‍ය බොහෝ දේ පවසා තිබේ.

මෙම දැවැන්ත සහ දේශපාලනිකව හැඩතල නොගත් විරෝධතා ව්‍යාපාරය බොහෝ මිථ්‍යාවන්ගෙන් - ඩිමොක්‍රැටික් පක්ෂය පිලිබඳව සහ ප්‍රතිසංස්කරන සඳහා පීඩනය යෙදීමේ හැකියාව පිලිබඳව - පෙලෙන්නා සේ ම ඇමරිකානු සමාජයේ ස්වභාවය පිලිබඳව බොලඳ සිත් ඇතිව සිටී. මෙම මිථ්‍යාවන් සැබෑ අන්තරායයන් මතු කරන අතර දේශපාලන අරගලය හරහා ඒවා ජය ගත යුතු ය.

එහෙත් යථාර්ථය වනුයේ සංක්‍රමනිකයන් ගැඹුරු වෙමින් පවත්නා නපුරු ඇමරිකානු සිහිනයක කොටස්කරුවන්ව සිටින බව යි. ඉරාක යුද්ධයේ දී ලතින් වාර්ගික සොල්දාදුවෝ සිය ගනනින් මිය ගියහ. ඉහල යන ගෑස් හා ඉන්ධන මිල ගනන් සහ එක තැන නැවතී තිබෙන හෝ කඩා වැටෙන වැටුප් කම්කරු පන්තියේ සියලු කොටස්වලට මෙන් ම සංක්‍රමනික කම්කරුවන්ට ද එක සේ බැට දෙයි.

ඇමරිකානු මස් ඇසුරුම් කර්මාන්තයේ සැලකිය යුතු කොටසක් ද ඇතුලු ව්‍යාපාර පුලුල් සංඛ්‍යාවක් වසා තැබීමට බල කෙරුනු ක්‍රියාවක් වන මැයි පලමු වන දා කැඳවූ වැඩපලවල් හා ඉස්ටෝරු වර්ජනය කිරීමේ ජාතික පරිමාන කැඳවුම කෙරෙහි පාලක ප්‍රභුව තුල තිබෙන වෛරයට හේතු වන්නේ කම්කරුවන්ගේ මෙම පොදු උවමනාව යි. ඔවුන් බියපත්ව සිටින්නේ කම්කරු පන්තියේ අනෙකුත් කොටස් මෙම ක්‍රියාව දැක, ''අපට ද මෙය කල නොහැක්කේ මන්ද?'' යනුවෙන් තමාගෙන් ම අසා ගනු ඇතැයි යන හේතුවෙනි.

## සංවිධානගත සංක්‍රමනික විරෝධී ප්‍රතිප්‍රහාරයක්

සංක්‍රමනිකයන්ගේ ක්‍රියාවන්ට එරෙහිව හඬ නංවන ''ප්‍රතිප්‍රහාරයන්'' පිටුපස පවතින්නේ මෙය යි. මෙම ප්‍රපංචයේ ඉතා ම ප්‍රතිගාමී, කුහක සහ දේශපාලනිකව අන්තරායකර ප්‍රකාශනය බුෂ්ගේ ධවල මන්දිරයෙන් ම පැමිනියේ, පසුබිම් හඬ පටිගත කිරීම්වල යෙදෙන ලතින් තාරකා ගනනාවක් විසින් නිෂ්පාදිත ඇමරිකානු ජාතික ගීයේ ස්පාඤ්ඤ භාෂා අනුවාදයක් අරබයා පෙනෙන ලෙසට විකාර සහගත වූ මතභේදයක් අවුලුවා ලමිනි.

ඇමරිකානු ජාතික ගීයේ ස්පාඤ්ඤ අනුවාදය ගැයුනු උද්සෝෂන රැලිවලට කිසිදු කාංසාවකින් තොරව බුෂ් මත් නිරන්තරයේ සහභාගි වූ බවට වන වාර්තා පිලිබඳව වගක් නැත. රිපබ්ලිකානු දේශපාලන ක්‍රියාකාරීන් විසින් ගැටලුව නිර්මානය කොට පුම්බනු ලැබුවේ රිපබ්ලිකන් පක්ෂය තුල සිටින, පරිපාලනයේ දේශපාලන පදනම සංස්ථාපනය කරන දක්ෂිනාංශික පරහීතික ස්තරයට ආයාචන කිරීමේ එල්ලය ඇතිව ය.

එවන් ආයාචනයක ඇති මුග්ධත්වය හා වගකීම් විරහිත භාවය විශ්මය ජනක වේ. ඉංග්‍රීසිය රාජ්‍ය භාෂාවක් බවට පත් කිරීමේ සංකල්පයට - ඇමරිකානු ව්‍යවස්ථාවේ කිසි තැනක සඳහන් නොවන දෙයකි - ඇමරිකානු ජනාධිපතිවරයා අනුග්‍රහය දැක්වීම, සමහර රටවල සිවිල් යුද්ධවලට මග පාදා තිබෙන තියුනු සමාජ ගැටුම් ඇති කරන ආකාරයේ කුපිත කිරීම් ඇවිලවීමේ තර්ජනය ගෙන එයි.

එවන් දක්ෂිනාංශික පසුගාමී ආයාචනයන්ට සමාන්තරව, ජාතික දේශපාලන චරිතයක් බවට පත්ව සිටින සීඑන්එන් අටුවාකාර ලූ ඩොබ්ස්ගේ සිට ෆැසිස්ට්වාදී මිනියුට්මන් සුපරීක්ෂකවරුන් හා වෘත්තීය සමිති නිලධරයේ කොටස් දක්වා පැතිරෙන, එකිනෙකාට විෂම වූ කොටස්වල දක්ෂිනාංශික ජනතාවාදී උද්සෝෂනය පවතී. ලේඛන රහිත

කම්කරුවන් මිලියන 12ක් ඇමරිකාවේ සිටීම හේතුවෙන් රැකියා නැති වීමට සහ වැටුප් අඩු වීමට ගොදුරු වූයේ යැයි පැවසෙන ඇමරිකානු කම්කරුවන් පිලිබඳව ඇති උත්සුකතාවෙන් සංක්‍රමනිකයන් කෙරෙහි වන තමන්ගේ වෛරය පෙලඹවෙන්නේ යැයි මේ සියලු දෙනා බොරුවට අඟවති.

මෙය ප්‍රතිගාමී මුසාවකි. රැකියා, ජීවන තත්වයන් සහ සමාජ සහන මත එල්ල වන ප්‍රහාර සංක්‍රමනිකයන්ගේ වරදකින් සිදු වන්නක් නොව ධනවාදී පද්ධතියේ - ලේඛන රහිත කම්කරුවන් දඩමීමුන් කර ගැනීමට වලි කන සියලු දෙනා විසින් ආරක්ෂා කෙරෙන ආර්ථික පද්ධතියේ - ගෝලීය අර්බුදය නිසා සිදු වන්නකි.

ඇමරිකාවේ හෝ වෙනත් ඕනෑ ම රටක කම්කරු පන්තියේ කිසිදු අයිතියක් හෝ අතීත ජයග්‍රහනයක් ආරක්ෂා කිරීම සංක්‍රමනිකයන්ට ජාතික ආර්ථිකය අහුරා තැබීම මගින අත් කර ගත නොහැකි ය. විදේශ සමාගම්වලට මෙන් ම කම්කරුවන්ට ද එරෙහිව " ඇමරිකානු රැකියා" ආරක්ෂා කිරීමේ දී මහා ව්‍යාපාරිකයන් සමග පොදු වූ උවමනාවක් ඔවුන්ට තිබේ යැයි කම්කරුවන්ට ඒත්තු ගැන්වීමට දශක ගනනාවක් මුලුල්ලේ වෑයම් කල ඇමරිකාවේ නිල වෘත්තීය සමිති ව්‍යාපාරයේ නින්දිත අසාර්ථකත්වයෙන් එවැනි ප්‍රවිෂ්ටයක ඇති නිස්සාරත්වය මනාව පෙන්නුම් කර දෙයි. ප්‍රතිඵලය වූයේ ඇමරිකානු අන්තර් ජාතික සංගත වඩ වඩාත් අඩු ශ්‍රම වියදම් සොයමින් සිය නිෂ්පාදන කටයුතු මෙක්සිකෝවට, චීනයට හා අන් තැන්වලට රැගෙන යද්දී ෆැක්ටරියකට පසු ෆැක්ටරියක් බැගින් වසා දැමීමත් ලක්ෂ ගනන් රැකියා විනාශ වීමත් ය.

කම්කරු පන්තියට සාර්ථක අරගලයක් ගෙන යා හැකි වනුයේ ගෝලීයව සංචලිත ප්‍රාග්ධනයට මුහුන දීමට තමන් ජාත්‍යන්තර පදනමක සංවිධානය වුව හොත් පමන ය. ජාත්‍යන්තරවාදී සහ සමාජවාදී ඉදිරි දර්ශනයක් මත පදනම් වූ පොදු අරගලයක් තුල කම්කරුවන් ජාත්‍යන්තරව එක්සත් කිරීමට සටන් කිරීම හැර, කම්කරුවන් තම වැටුප්වල හෝ සේවා කොන්දේසිවල දැඩි කප්පාදු නොපිලිගන්නේ නම් ඔවුන් අඩු වැටුප් ගෙවන රටවලට තමන්ගේ රැකියා පුද කල යුතු යැයි සේව්‍යයන් කම්කරුවන්ට කරන අනාවරන ඉල්ලීමට දිය හැකි වෙනත් විසඳුමක් නැත.

මෙය පුරවැසි භාවය පිලිබඳ සම්පූර්න ප්‍රජාතාන්ත්‍රිය හා සමාජීය අයිතීන් සහිතව තමන් තෝරා ගන්නා ඕනෑම රටක - ඇමරිකාව ද ඇතුලත්ව - ජීවත් වීමට හා වැඩ කිරීමට කම්කරු ජනතාවට ඇති අයිතිය තිරසරව ආරක්ෂා කිරීම සමග ඒකාබද්ධ විය යුතු ය.

තරුන කම්කරුවන්ගේ අයිතීන්ට පහර දීමටත් සමස්ත කම්කරු පන්තියට ම ප්‍රන්ස ධනවාදයේ අර්බුදයට වන්දි ගෙවීමට සැලැස්වීමටත් විරාක් ආන්ඩුව ගත් ප්‍රයත්නයන්ට එරෙහිව ශිෂ්‍යයන්, කම්කරුවන් හා සංක්‍රමනික තරුනයන් එකට එක් කල ප්‍රන්සයෙහි ජනතා විරෝධතා පුපුරා ගොස් යන්තම් සති ගනනක් පමනක් ඉක්ම යද්දී ඇමරිකාවේ අතිදැවැන්ත පෙලපාලි ඇති වීම අහම්බයක් නො වේ.

ගෝලීය ධනවාදයට එරෙහිව ජාත්‍යන්තර කම්කරු පන්තියේ බලගතු හා ඒකාබද්ධ ප්‍රහාරයක් සඳහා කොන්දේසි මතු වෙමින් තිබේ. ගෝලීයකරනය වෘත්තීය සමිතිවල පැරනි ජාතික ප්‍රතිසංස්කරනවාදී දිසාවනතිය අකර්මන්‍ය කර දැමුවා පමනක් නො ව එය සියලු ම රටවල කම්කරුවන් මත කිසි දා නොවූ තරම් සමාන වූ කොන්දේසි පනවමින් ලෝක පරිමානව කම්කරු ජන සංඛ්‍යාව නාටකාකාරව ඉහල දමා ද තිබේ.

ඇමරිකානු කම්කරු ජනයා යුරෝපයේ, ආසියාවේ, ලතින් ඇමරිකාවේ සහ අනෙකුත් තැන්වල ඔවුන්ගේ පන්ති සොහොයුරන්, සොහොයුරියන් සමග පොදු සමාජවාදී සහ ජාත්‍යන්තරවාදී පිලිවෙතක පදනම මත එක්සත් කිරීමේ අරගලය සඳහා ඩිමොක්‍රැටික් පක්ෂයෙන් සමහන් කල නොහැකි ලෙස බෙදී වෙන් වීම අවශ්‍ය කරයි. සංක්‍රමනිකයන්ගේ අයිතීන් සහ ප්‍රජාතාන්ත්‍රිය අයිතීන් සේ ම රැකියා සහ ජීවන තත්වයන් ද ආරක්ෂා කිරීමට කැප වූ කම්කරු පන්තියේ නව සමාජවාදී ව්‍යාපාරයක් ගොඩ නැගිය යුතු ය.

එවන් ව්‍යාපාරයක් මතු කර ලීමට අවශ්‍ය දේශපාලනික පදනම් සකසනු පිනිස 2006 මැතිවරනයේ දී සමාජවාදී සමානතා පක්ෂය තමන්ගේ ම අපේක්ෂකයන් ඉදිරිපත් කරමින් මැදිහත් වේ. අපි මෙම උද්ඝෝෂනයේ දී සියලු ම ආකාරයේ සංක්‍රමනික-විරෝධී ස්වෝත්තමවාදයන්ට එරෙහිව අචල සටනක් ගෙන යන අතර සංක්‍රමනික කම්කරුවන්ගේ ඉල්ලීම්වලට දේශපාලනිකව හඬක් දීමට ද ඔවුන්ගේ අරගලය රට තුල උපන් ඇමරිකානු කම්කරුවන් හා ලොව පුරා ම කම්කරුවන් යන දෙකොටසේ ම අරගලය සමග ඒකාබද්ධ කිරීමට ද උත්සාහ කරන්නෙමු.

සංක්‍රමනිකයන්ගේ අයිතීන්ට සහාය දෙන්නා වූ ද සමස්තයක් ලෙස කම්කරු ජනයාගේ අරගලය ඉදිරියට ගෙන යාමට අවශ්‍ය වන්නා වූ ද සියලු දෙනාගෙන්, අපේ ක්‍රියා මාර්ගය අධ්‍යයනය කරන ලෙස ද ඡන්ද පත්‍රිකාවෙහි අපගේ අපේක්ෂකයන්ගේ නම් ඇතුලත් කිරීමේ උද්ඝෝෂනයට සහභාගි වන ලෙස ද කම්කරු පන්තිය තුල නව විප්ලවවාදී නායකත්වයක් ගොඩ නැගීම සඳහා ගෙන යන අරගලයේ දී සමාජවාදී සමානතා පක්ෂය සමග එක් වන ලෙස ද අපි ඉල්ලා සිටිමු.

© www.wsws.org